# ගුරු භවතුන්ගේ පෞද්ගලික ලිපි ගොනුවෙහි ඇතුලත් විය යුතු ලිපි ලේඛන

01. පළමු පත්වීමේ ලිපිය : ස්ථිර/ අභ්‍යාසලාභී/ උපාධි අභ්‍යාසලාභී/ ශිෂ්‍ය ගුරු/ ගුරු ආධුනික/ ගුරු සහායක/ කොන්ත්‍රාත්/ තාවකාලික පත්වීම් ලිපිය

02. පළමු පත්වීම ස්ථිර පත්වීමක් නොවේ නම් ස්ථිර විශ්‍රාම වැටුප් සහිත පත්වීම් ලිපිය

03. පළමු පත්වීම තාවකාලික පත්වීම් ලිපියක් නම්, ස්ථිර පත්වීම් ලිපිය.

04. පළමු පත්වීම් ලිපිය විශ්‍රාම වැටුප් රහිත පත්වීම් ලිපියක් නම්, ස්ථිර විශ්‍රාම වැටුප් සහිත පත්වීම් ලිපිය.

05. සාමාන්‍ය අභ්‍යාසලාභී පත්වීම උපාධි අභ්‍යාසලාභී තනතුරකට පරිවර්තනය කර ඇත්නම් එම ලිපිය.

06. උප්පැන්න සහතිකය.

07. පළමු පත්වීම් ලිපියේ සඳහන් නම හා උප්පැන්න සහතිකයේ සඳහන් නම අතර වෙනසක් ඇත් නම්, නම සංශෝධනය කළ පත්වීම් ලිපිය හෝ නම සංශෝධනය කළ උප්පැන්න සහතිකය.

08. නම් වෙනස් කිරීමක් සිදු කර ඇත්නම්, එසේ නම් වෙනස් කරන ලද උප්පැන්න සහතිකය. ( 13 තීරයේ සංශෝධනය සහිත) හෝ/ හා "භාණ්ඩාගාර 185" ප්‍රකාර ප්‍රකාශ පත්‍රය.

09. ජාතික හැඳුනුම්පතෙහි පිටපත.

10. ගිවිසුම් පත්‍රය (පොදු 160)

11. ප්‍රතිඥාව (පොදු 278)

12. දිවුරුම ( අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 6 වන සංශෝධනය අනුව)

13. වත්කම් ප්‍රකාශය (පොදු 261)

14. මුල් පත්වීමට අනුව වැඩ භාර ගැනීමට අදාලව හෝ තාවකාලික/ අනියම්/ කොන්ත්‍රාත්/ ස්ථිර යනාදී වශයෙන් පත්වීමේ ස්වභාවය වෙනස් වී ඇත්නම් ඊට අදාල ලොග් සටහන් උධෘතය.

15. මුල් පත්වීමට අදාලව පාසලක වැඩ භාර නොගෙන අධ්‍යාපන අමාත්‍යාංශයේ හෝ දෙපාර්තමේන්තුවේ හෝ කලාප අධ්‍යාපන කාර්යාලයක හෝ වෙනත් ස්ථානයක වැඩ භාර ගත්තේ නම්, ඒ බව සනාථ කෙරෙන ලිපි.

16. වැඩ භාර ගැනීමේ ලිපිය හා වැඩ භාරගැනීමේ ලොග් සටහනෙහි උධෘතය.

17. වෛද්‍ය වාර්තාව (පොදු 169)

18. 1990.01.01 දිනට පෙර පත්වීමක් නම්, ඌව පළාත් සභා රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කරන ලද ලිපිය.

19. පළමු පත්වීමේ සිට යාවත්කාලීන කරනු ලබන චර්යා සටහන් පත්‍රය (පොදු 53 අ)

20. විවාහක නම්, විවාහ සහතිකය.

21. විවාහක නම්, කලාත්‍රයාගේ උප්පැන්න සහතිකය.

22. දික්කසාද වී නම්, දික්කසාදවීමේ සහතිකය / නියත තීන්දුවේ සහතික කළ පිටපත.

23. කලාත්‍රයා මියගොස් නම්, එම මරණය ලියාපදිංචි කිරීමේ සහතිකය.

24. දරුවන් සිටී නම්, දරුවන්ගේ උප්පැන්න සහතික.

25. සියළුම අධ්‍යාපන සහතික. (අ.පො.ස. (සා/පෙළ), අ.පො.ස. (උ/පෙළ), උපාධි, පශ්චාත් උපාධි හා වෙනත්)

26. සියළුම වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික ( ගුරු පුහුණුව, ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා හා වෙනත්)

27. සියළුම අධ්‍යාපන සහතිකවල හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ ඉදිරිපත් කර ඇති සහතිකවල ප්‍රතිඵල සනාථ කිරීමේ ලිපි.

28. පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කිරීමේ ලිපිය.

29. පරිවාස කාලය දීර්ඝ කර ඇත්නම්, ඊට අදාලව පත්වීම් බලධරයා විසින් නිකුත් කරන ලද ලිපිය.

30. ගුරු ලියාපදිංචි අංකය.

31. වැන්දඹු අනත්දරු / වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ දායක වීමේ අයදුම් පත් පිටපත.

32. එහි ලියාපදිංචි කරන ලද අංකය සහිත කාඩ්පත.

33. වෙනත් පළාතක හෝ ජාතික පාසලක පත්වීම් ලබා සිටියේ නම් හෝ සේවය කළේ නම්, එම පළාතෙන් හෝ මධ්‍යම රාජ්‍ය සේවයෙන් නිදහස් කිරීමේ ලිපිය.

34. එලෙස ඌව පළාත් සභා රාජ්‍ය සේවයට පැමිණියේ නම්, ඌව පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීමේ ලිපිය.

35. සෑම වර්ෂයකටම අදාලව වැටුප් වර්ධක අනුමත කරන ලද අයදුම් පත්.

36. සෑම වර්ෂයකම ප්‍රමාණය කරන ලද ගුරු කාර්ය සාධන වාර්තා.

37. වාර්ෂික නිවාඩු විස්තර. (බී - 100 ආකෘතිය මඟින් සම්පූර්ණ කරන ලද)

38. වැටුප් රහිත නිවාඩු සඳහා නිවාඩු හිලව් කර ඇත්නම්, එම හිලව් කිරීම අනුමත කළ ලිපි.

39. වැටුප් රහිත නිවාඩු ලබා ඇත්නම්, නිවාඩු වර්ග කිරීමේ ලිපි හා වැටුපෙන් අය කිරීමේ නියෝග ලිපි.

40. ශ්‍රී ලංකා ගුරු සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයන් අනුව අන්තර්ග්‍රහණය කරන ලද ලිපි/ මුල් පත්වීමේ ලිපිය සංශෝධනය කළ ලිපි.

41. නව ගුරු සේවා ව්‍යවස්ථාව අනුව සම්පූර්ණ කළ යුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ (මොඩියුල) සම්පූර්ණ කර ඇත්නම්, ඊට අදාල ලියවිලි.

42. නව ගුරු සේවා ව්‍යවස්ථාව අනුව සම්පූර්ණ කළ යුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ (මොඩියුල) සම්පූර්ණ කර ඇත්නම්, ඊට අදාල ලියවිලි.

43. සේවා උසස්වීම් ලබා ඇත්නම්, එම උසස්වීම් ලිපි.

44. උසස්වීම් අනුව වැටුප් පරිවර්තනය කරන ලද ලිපි.

45. අදාල වැටුප් වැඩි කිරීමේ හෝ වැටුප් ප්‍රතිශෝධනය කිරීමේ චක්‍රලේඛ අනුව වැටුප් පරිවර්තනය කරන ලද ලිපි.

46. සේවයේ ස්ථාන මාරුවීම් ලිපි.

47. ස්ථාන මාරුවීම් අනුව වැඩභාර ගැනීමේ ලිපි හා ලොග් සටහන් උධෘතය.

48. තාවකාලික සේවා අනුයුක්ත ලබා ඇත්නම් එම අනුයුක්ත කිරීමේ ලිපි හා අනුයුක්ත දීර්ඝ කිරීමේ ලිපි.

49. අධ්‍යයන නිවාඩු ලබා තිබේ නම්, එම නිවාඩු අනුමත කරන ලද ලිපි.

50. ඇප බැඳුම් කර ( අදාල වන පරිදි)

51. විදේශ නිවාඩු ලබා ඇත්නම්, එම නිවාඩු අනුමත කරන ලද ලිපි.

52. ආපසු මෙරටට පැමිණීම දැනුම් දෙන ලද ලිපි හා ලොග් සටහනේ උධෘතය.

53. විදේශ නිවාඩු සංශෝධනය වී ඇත්නම්, එම සංශෝධන ලිපි.

54. රජයේ නිල නිවාසවල පදිංචිව සිටියේ නම්, එම නිවාස කුලී අය කිරීම පිළිබඳ ලිපි.

55. ප්‍රසංශා සහ දෝශ දර්ශන ( තිබේ නම්- පොදු 230බි)

56. සේවා ඇගයීම් සහතික (උදා :- ගුරු ප්‍රතිභා ප්‍රනාම)

57. විනය නියෝග ( තිබේ නම්)

58. විනය නියෝග ක්‍රියාත්මක කිරීමට අදාල ලිපි ( තිබේ නම්)

59. විනය නියෝග සම්බන්ධව අභියාචනා ඉදිරිපත් කර ඇත්නම් හා එම අභියාචනා මත සහන සලසා ඇත්නම්, එම නියෝග.

60. භාෂා ප්‍රවීනතාව පිළිබඳ සහතිකය (තිබේ නම්)

61. නමෙහි වෙනසක් ඇත්නම්, අදාල සංශෝධන ලිපි.

62. නමෙහි වෙනසට අදාල දිවුරුම් ප්‍රකාශ.

63. පැවිදි වූයේ නම්, සාමනේර භික්ෂු සහතිකය හෝ උපසම්පදා සහතිකය.

64. උපැවිදි වූයේ නම්, උපැවිදි සහතිකය.

65. ණය කාඩ් පත.

66. යම් රෝග සම්බන්ධයෙන් වෛද්‍ය මණ්ඩලකය වෙත ඉදිරිපත් වූයේ නම්, වෛද්‍ය මණ්ඩල I හා II වාර්තා.

67. වෛද්‍ය මණ්ඩල නිර්දේශ මත විශේෂ අසනීප නිවාඩු ලබා ඇත්නම්, එම නිවාඩු අනුමත කරන ලද ලිපි.

68. ශ්‍රී ලංකා විදුහල්පති සේවයට අයදුම් කළේ නම්, අයදුම් පතෙහි පිටපත.

69. ශ්‍රී ලංකා විදුහල්පති සේවයට තෝරා ගනු ලැබූ වේ නම්, එම පත්වීම් ලිපිය.

70. එම නව තනතුරේ වැඩ භාර ගැනීමේ ලිපිය හා ලොග් සටහනේ උධෘතය.

71. ඒ අනුව පෙර දැරූ තනතුරින් මුදා හැරීමේ ලිපිය.

72. ශ්‍රී ලංකා වැදුහල්පති සේවයට පත් වූයේ නම්, ඊට අදාලව වැටුප් පරිවර්තනය කිරීමේ ලිපිය.

73. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ තනතුරක් සඳහා අයදුම් කළේ නම්, එම අයදුම් පතෙහි පිටපත. (සීමිත/ කුසලතා)

74. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය සඳහා තෝරා පත්කර ගනු ලැබූ වේ නම්, එම පත්වීම් ලිපිය.

75. එම නව තනතුරේ වැඩ භාර ගැනීමේ ලිපිය හා ලොග් සටහනේ උධෘතය.

76. ඒ අනුව පෙර දැරූ තනතුරෙන් මුදා හැරීමේ ලිපිය.

77. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට පත්වූයේ නම්, ඊට අදාලව වැටුප් පරිවර්තනය කිරීමේ ලිපිය.

78. ගුරු තනතුරට පත්වීමට ප්‍රථම, රාජ්‍ය සේවයේ වෙනත් තනතුරක් දැරුවේ නම්, එම පත්වීම් ලිපිය හා එම තනතුරින්/ සේවා ස්ථානයෙන් විධිමත් පරිදි නිදහස් කිරීමේ ලිපිය.

79. පෙර තනතුරේ වැඩ භාර ගැනීමේ ලිපිය.

80. පෙර තනතුරින් මුදා හැරීමේ ලිපිය.

81. සේවා කාලය තුල සේවය හැර යාමක් සිදු වී ඇත්නම්, තනතුර හැරයාමේ නියෝගය.

82. නැවත සේවයේ පිහිටුවා ඇත්නම්, නැවත සේවයේ පිහිටුවන ලද ලිපිය.

83. සේවා ස්ථාන සටහන.

84. හදිසි අනතුරු නිවාඩු ලබා ඇත්නම්, එම හදිසි අනතුරු නිවාඩු විධිමත් පරිදි අනුමත කරන ලද ලිපිය.

85. ප්‍රසූත නිවාඩු හා පීතෘත්ව නිවාඩු ලබා ඇත්නම්, එම නිවාඩු අනුමත කරන ලද ලිපි හා වෛද්‍ය සහතික.

86. අඩ වැටුප් සහිත ප්‍රසූත නිවාඩු ලබා ඇත්නම්, එම නිවාඩු අනුමත කිරීමේ ලිපිය.

87. වැටුප් රහිත ප්‍රසූත නිවාඩු ලබා ඇත්නම්, එම නිවාඩු අනුමත කිරීමේ ලිපිය.

88. එම නිවාඩු අතරතුර හෝ අවසානයේ හෝ සේවයට වාර්තා කරන ලද බවට දැනුම් දීමේ ලිපිය හා ලොග් සටහන් උධෘතය.

89. රාජ්‍ය සේවක දේපළ ණය ලබා ඇත්නම්, එම ණය අනුමත කිරීමේ ලිපි හා ණය අය කර ගැනීම පිළිබඳ වාර්තා.

90. පළාත් සභා හෝ පළාත් පාලන මැතිවරණයක දී අපේක්ෂකයකු වශයෙන් ඉදිරිපත් වූයේ නම්, ඒ බව දැනුම් දීමේ ලිපිය.

91. මැතිවරණ නිවාඩු අනුමත කරන ලද ලිපිය.

92. මැතිවරණ නිවාඩු හිලවු කර ඇත්නම්. නිවාඩු හිලව් කිරීමේ ලිපිය.

93. ජාතික ශිෂ්‍ය භට බලකායට හෝ සක්‍රීය සේවයට අනුයුක්තව සිටියේ නම්, එම රාජකාරී සඳහා කැඳවීමේ ලිපිය.

94. සක්‍රීය සේවය සඳහා මුදා හැරීමේ අයඳුම් පත්‍රයේ පිටපත.

95. සක්‍රීය සේවයට මුදා හැරීමේ ලිපිය.

96. සක්‍රීය සේවය අවසන් කිරීමේ ලිපිය/ ගමන් නියෝගය.

97. නැවත නිත්‍ය සේවයට වාර්තා කරන ලද බව දැනුම් දීමේ ලිපිය හා ලොග් සටහන් උධෘතය.

98. දේශපාලන අධිකාරිය වෙත අනුයුක්තව සිටියේ නම්, එම අනුයුක්තය සඳහා වන ඉල්ලීම හා නිර්දේශ.

99. අනුයුක්ත කිරීම හෝ මුදා හැරීමේ ලිපිය.

100. එම කාල සීමාව තුල වැටුප් ගෙවීම් පිළිබඳ ලිපි.

101. එම අනුයුක්ත කිරීම්/ මුදා හැරීම් කාලය අවසන්ව නිත්‍ය සේවයට වාර්තා කිරීම දැනුම් දීමේ ලිපිය හා ලොග් සටහන් උධෘතය.

102. වෙනත් යම් ආයතනයක සේවය සඳහා ද්විතීයන පදනම මත පත්වීම් ලබා සිටියේ නම්, එම පත්වීම/ කැඳවීමට අදාල ලිපි.

103. ඒ සඳහා මුදා හැරීමේ ලිපිය.

104. එම සේවය අවසන්ව නැවත නිත්‍ය සේවයට වාර්තා කරන ලද බව දැනුම් දීමේ ලිපිය හා ලොග් සටහන් උධෘතය

105. යම් තනතුරක වැඩ බැලුවේ නම්, එම වැඩ බැලීම සඳහා ඉල්ලීම් ලිපිය හෝ අයඳුම් පත.

106. වැඩ බැලීම සඳහා පත් කිරීමේ ලිපිය.

107. තනතුරෙහි වැඩ බැලීමට භාරගත් බව දන්වන ලද ලිපිය.

108. තනතුරෙහි වැඩ බැලීම දීර්ඝ කළේ නම්, ඊට අදාල ලිපි.

109. සේවයෙන් ඉල්ලා අස් වූයේ නම්, ඉල්ලා අස් වන බව දන්වන ලද ලිපිය.

110. ඉල්ලා අස්වීමේ කොන්දේසී දැනුම් දෙන ලද ලිපිය.

111. කොන්දේසී පිළිගන්නා ලද බව දැනුම් දෙන ලද ලිපිය.

112. ඉල්ලා අස්වීම පිළිගත් බව දැනුම් දෙන ලද ලිපිය.

113. හදිසි අනතුරු වන්දි ලබා ඇත්නම්, වන්දි අයදුම් පතේ පිටපත.

114. හදිසි අනතුරු වන්දි අනුමත කළ ලිපිය.

115. වන්දි ගෙවූ බවට වන ලිපි/ සටහන්.

116. එම වන්දි යැපෙන්නන් වෙත ගෙවන්නේ නම්, ඒ පිළිබඳ නියෝග.

117. සේවයේ යෙදී සිටිය දී මිය ගියේ නම්, මරණ ලියා පදිංචි කිරීමේ සහතික.

118. මරණ පාරිතෝෂිතය සකස් කරන ලද ලිපිය.

119. වැන්දඹු අනත්දරු ගෙවීම් සඳහා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ හා ප්‍රාදේශීය ලේකම් වෙත යවන ලද උප ගොනුවේ පිටපත.

120. මරණ පාරිතෝෂිතය යැපෙන්නන් වෙත ගෙවන්නේ නම්, ඒ පිළිබඳව නියෝගය.

121. එම ගෙවීම් ගණනය කිරීම් හා ගෙවීම් පිළිබඳව සටහන්.

122. සේවයෙන් විශ්‍රාම ලැබුවේ නම්, විශ්‍රාම ගැන්වීම සඳහා ඉල්ලීමේ ලිපිය.

123. විශ්‍රාම ගැන්වීමේ ලිපිය.

124. මාර්ගගත ක්‍රමය ඔස්සේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත තොරතුරු වාර්තා කිරීමෙන් පසු ලබාදෙන PD 03 ආකෘතියේ පිටපත.

125. විශ්‍රාම වැටුප් සකස් කරන ලද ලිපිය. (ප්‍රදාන පත්‍රය)

126. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ හා ප්‍රාදේශීය ලේකම් වෙත යවන ලද උප ගොනුවේ පිටපත.

127. විශ්‍රාම පූර්ව නිවාඩු ලැබුවේ නම්, එම නිවාඩු අනුමත කරන ලද ලිපිය.

**ගුරු ආයතන අංශය**
**ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**